ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**

---

# විශේෂ නිවේදනයයි

## බාහිර උපාධි පරීක්ෂණ සඳහා ලියාපදිංචි වී විදේශගතව සිටින උපාධි අපේක්ෂකයන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පරීක්ෂණ පැවැත්වීම

බාහිර උපාධි පරීක්ෂණ සඳහා ලියාපදිංචි වූ එහෙත් විදෙස්ගත වීමට සිදුවී ඇති අපේක්ෂකයින්ගේ ඉල්ලීම් පරිදි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පරීක්ෂණයන්ට පෙනී සිටීමට අවස්ථාව ලබා දීමට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව විසින් තීරණය කර ඇත.

අධීක්ෂණ මාර්ගගත පරීක්ෂණයට (Online Supervised Examination) අදාල ගෙවීම් එම අවස්ථාවේ පවතින විනිමය අනුපාතය අනුව ඩොලර් මුදල් ඒකකයෙන් සිදුකළ යුතුය.

ඒ අනුව බාහිර උපාධි පරීක්ෂණ සඳහා උක්ත ක්‍රමවේදය ඔස්සේ පෙනී සිටීමට අපේක්ෂා කරන විදේශගතව සිටින සිසුන්,

- විභාගය සඳහා අයදුම්පත් යොමු කිරීමේ අවසන් දිනට පෙර

හෝ

- එසේ කිරීමට නොහැකි වූ අවස්ථාවක (අයදුම්පත් යොමු කිරීමෙන් පසුව විදේශගත වූයේ නම්) විභාගය පැවැත්වීමට දින 21කට පෙර

පහත දක්වා ඇති Google පෝරමය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

# <u>අධීක්ෂණ මාර්ගගත</u> විභාගය සඳහා පොදු උපදෙස්

**1. අධීක්ෂණ මාර්ගගත විභාගය සඳහා උචිත පරිසරයක් නිර්මාණය කර ගැනීම**

විභාග අපේක්ෂකයන් විසින් අධීක්ෂණ මාර්ගගත විභාගයට පෙනී සිටීම සඳහා උචිත පරිසරයක් සකසා ගත යුතුය (විභාගය සඳහා බාධා නොවන පරිදි නිවසේ හෝ වෙනත් සුදුසු ස්ථානයක් තෝරා ගන්න).

**2. අනිවාර්ය උපාංග**

**උපාංග අංක 1 ;** අන්තර්ජාල පහසුකම් සහිත ස්මාර්ට් ජංගම දුරකථනයක් (Smart Mobile Phone).

**උපාංග අංක 2 ;** ප්‍රශ්න පත්‍රය කියවා ගැනීම සඳහා භාවිතයට ගත හැකි Laptop, Desktop, Tablet හෝ Smart Phone එකක්. මෙම උපාංගය සඳහා අන්තර්ජාල පහසුකම් තිබීම යෝග්‍ය වේ. එවිට LMS හරහා ප්‍රශ්නපත්‍රය බාගත කරගත හැකි වේ.

**උපාංග අංක 3 ;** පිළිතුරු පත්‍රය scan කර එක් pdf ගොනුවක් ලෙස සකසා ඉගෙනුම් පද්ධතියට (LMS) සකසා ඉගෙනුම් පද්ධතියට උඩුගත කළ හැකි අන්තර්ජාල සම්බන්ධතා සහිත එකක් විය යුතු ය.

**3. අධීක්ෂණ මාර්ගගත විභාගය පිළිබඳ හැඳින්වීම හා ඒ සඳහා පුහුණු වීම/ Introduction Meeting & Mock Examination**

අධීක්ෂණ මාර්ගගත විභාග සඳහා අපේක්ෂකයන් සූදානම් කරවීම පිණිස විභාගයට පෙර ඒ පිළිබඳ හඳුන්වාදීමේ සැසියක් (Introduction Meeting) හා පෙරහුරු විභාගයක් (Mock Examination) බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මඟින් පවත්වනු ලැබේ. විභාග අපේක්ෂකයන් ඒ සඳහා සහභාගීවීම අනිවාර්ය වේ. පෙරහුරු විභාගය (Mock Examination) පවත්වනු ලබන්නේ මුදල් ගෙවා අයදුම්කල අයදුම්කරුවන් සඳහා පමණි.

- **විභාග අපේක්ෂකයන් විසින් අධීක්ෂණ මාර්ගගත විභාගයට පෙනී සිටීමට අවශ්‍ය බවට ඉල්ලීම් ලිපියක් පහත සඳහන් ඊ මේල් ලිපිනයට එවිය යුතුය.**
- **විභාග අයදුම්පත් යොමු කිරීමෙන් පසුව විභාග සඳහා පෙනී සිටින අපේක්ෂකයින් වෙත අධීක්ෂණ මාර්ගගත විභාග මාර්ගෝපදේශය (Student's Guideline) ඊ මේල් හරහා යොමු කරනු ලැබේ.**



ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025-10-14

**විමසීම - exams.edecu@sjp.ac.lk**